# හරිත ජාතික ගිණුම

වර්තමාන ලෝකයේ සංවර්ධිත රටවල් හා සංවර්ධනය වෙමින් පවතින රටවල් කියල සරල වර්ගීකරණයක් තියෙනව. ඒ සරල වර්ගීකරණයම සංවර්ධනය වූ හා ඌන සංවර්ධිත රටවල්, උතුරේ හා දකුණේ රටවල්, පළමු ලෝකයේ රටවල්, දෙවන ලෝකයේ රටවල් හා තුන්වැනි ලෝකයේ රටවල් වශයෙන් ද නම් කරනව. මේ මොනවිධියේ වර්ගීකරණයකට වුනත් පාදක කරගෙන තියෙන්නෙ සංවර්ධනය කියන ආර්ථික සාධකයයි. අද ලෝකය මොනතරම් තාක්ෂණික වශයෙන් පෙළහර පෑවත්, තාක්ෂණික මෙවලම් භාවිත කළත්, නොයෙක් තාක්ෂණික උපකරණ නිෂ්පාදනය කළත් තවම ලෝක ජනගහනයෙන් 2/3 ක් පමණ ජීවත් වෙන්නෙ මූලික මිනිස් අවශ්‍යතාවන්වත් ඉටුකර ගැනීමට බැරිවයි. ඒ අය දරිද්‍රතාවේ පතුලේ ඉන්නෙ. විශේෂයෙන්ම විරැකියාව, උද්ධමනය, ආහාර හිඟකම, ලෙඩරෝගවලින් පෙළීම, ආදායම් විෂමතාව, යුද්ධය හා රසායනික භාවිතය වැනි ආර්ථික සාධක මානව පැවැත්ම මිනිසාට තිත්ත කරමින් පවතිනවා.

සැබෑ තත්ත්වය මෙසේ ඛේදජනක මට්ටමින් වර්ධනය වෙද් දී සෑම රටක්ම ත්‍රෛයිමාසිකව, අර්ධ වාර්ෂිකව හා වාර්ෂිකව ආර්ථිකයේ වර්ධනය ගණනය කරනවා. ලෝක දරිද්‍රතා මට්ටමෙන් පහළ ජන කොටස්වල පරිමාව මොනතරම් පුළුල් වුණත්, පසුගිය වසරට සාපේක්ෂව මේ වසරේ ආර්ථික වර්ධනය 'මෙච්චර' වැඩිවෙලා තියෙනව කියල සංඛ්‍යා දත්තවලින් පෙන්නනවා. ඒ විතරක් නෙමෙයි ඊළඟ වර්ෂයේ ආර්ථික වර්ධනය 'මෙන්න මේ මට්ටමට ගේනව' කියලා පුරෝකථන කරනවා.

**ආර්ථික නිර්ණායක**

මේ සමඟම ආර්ථික විද්‍යාඥයන්, විශේෂඥයන් හා විශ්ලේෂකයන් අතින් විශේෂ වචන තුනක් හරහා ආර්ථිකයේ අවස්ථා තුනක් විග්‍රහ කෙරෙනවා. ඒ වචන තුන තමයි අ). ආර්ථික වර්ධනය ආ). ආර්ථික සංවර්ධනය ඇ). තිරසාර ආර්ථික සංවර්ධනය කියන්නේ. ප්‍රස්තුතයට ළඟා වීමට ප්‍රථමයෙන් මේ ගැන නිරවුල්ව අවබෝධයක් ලබා ගත යුතු වෙනවා.

### අ) ආර්ථික වර්ධනය

සමාජවාදී හෝ ධනවාදී හෝ මි ශ්‍ර ආර්ථික රටාවක හුස්ම ගන්නා ජනතාවගේ ජීවන රටාව වඩාත් යහපත් කිරීම තමයි ඒ ඒ අර්ථ ක්‍රමයේ වගකීම. තවත් සරලව කියනව නම් රටේ ජීවත් වන ජනතාවගේ වුවමනාවන් සපුරාලීමේ ප්‍රමාණය ඉහළ මට්ටමකට ඔසවා තැබීමයි. ඒ සඳහා වුවමනා කරන භාණ්ඩ හා සේවා නිෂ්පාදනයත්, බෙදාහැරීමත් වැඩි කරන්න ඕනේ. අන්න ඒ විදියට නියමිත කෙටි කාලයක් ඇතුළත දී නිපදවන ලද භාණ්ඩ හා සේවාවන්ගේ සීමාව පසුගිය දීර්ඝකාලීන සීමාවත් එක්ක සංසන්දනය කරල බලන කොට ප්‍රමාණාත්මකව ඒවා ඉහළ මට්ටමකට ගිහිල්ල තියෙනව නම් එය ආර්ථික වර්ධනය හැටියට සඳහන් කරනවා.

### ආ) ආර්ථික සංවර්ධනය

ඉහතින් දැක්වූ ආර්ථික වර්ධනයත් සමඟ පවතින ආර්ථිකයේ සිදුවන ව්‍යුහාත්මක දියුණුව ආර්ථික සංවර්ධනය හැටියට සඳහන් කරන්න පුළුවන්. ඒක තවදුරටත් සරල විදියට කියනව නම්, මූර්ත ඒක පුද්ගල නිෂ්පාදනය අඛණ්ඩව ශීඝ්‍රයෙන් ඉහළ යාමත්, භාවිත කරන ශිල්පීය ක්‍රමවල දියුණුවක් ඇතිවීමත්, සමාජීය ජීවිතවල දියුණුවක් ඇතිවීමත්, ආර්ථික සංවර්ධනය විදියට සැලකෙනව. එහෙම නම් දීර්ඝ කාලයක් තිස්සේම, පසුගිය කාලයකට සාපේක්ෂව අඛණ්ඩව සිදුවන නිෂ්පාදන හා බෙදාහැරීමේ රටාවේ දීර්ඝකාලීන වර්ධනයට ආර්ථික සංවර්ධනය කියල කියනවා.

### ඇ) තිරසාර ආර්ථික සංවර්ධනය

කිසියම් රටක් සතුව පවත්නා ස්වභාවික සම්පත් උපයෝගී කරගෙන, දිගින් දිගටම පවත්වා ගත හැකි එක්තරා මට්ටමක ආර්ථික ප්‍රගතියක් තිරසාර ආර්ථික සංවර්ධනය කියල හඳුන්වනවා. තවත් සරල විදියට කියනව නම්, මෙහි දී වර්තමාන පරම්පරාව පරිහරණය කරන සම්පත් ප්‍රමාණයම කිසිදු අඩුවීමකින් තොරව අනාගත පරම්පරාවටත් භුක්ති විඳින්නට ඉඩකඩ සැලසීමයි. රටේ සමස්ත ජනතාවටම මෙහි ප්‍රතිඵල භුක්ති විඳින්නට සැලසීම මෙහි විශේෂ ලක්‍ෂණයක්. ඒ අනුව සමස්ත සමාජය තුළම ආර්ථික, සාමාජික හා සංස්කෘතිකමය ප්‍රබෝධයක් ඇතිවෙනවා. එය තිරසාරව පවත්වා ගැනීම සඳහා යොදා ගන්නා මූලික සාධක කීපයකුත් තියෙනවා. ඒ කියන්නේ 1 ජනගහනය 1 මානව සම්පත 1 ආහාර 1 සෞඛ්‍යය 1 ආරක්‍ෂාව 1 බලශක්තිය 1 කර්මාන්ත 1 නාගරික සංවර්ධනය 1 ශාඛ හා සත්ත්ව විශේෂ 1 පරිසර පද්ධතිය ආදී සාධක මූලිකවම සලකා බලනවා.

මෙහි දී අපගේ ප්‍රස්තුතය වන්නේ සංවර්ධනයේ නාමයෙන් අභියෝගයට ලක්වන පරිසර පද්ධතියයි. ලෝක ඉතිහාසයේ ශත වර්ෂ දෙක තුනක් ඇතුළත දී සිදු නොවූ තරමේ පරිසර විපර්යාස හා ඉන් මානව පැවැත්ම අභියෝගයට ලක් කෙරෙන සංසිද්ධීන් එක පිට එක ගලා එන හැටි අතිශය ඛේදජනකයි. මෙම ලිපියේ මුලින්ම පෙළගස්වා තිබෙන්නේ එබඳු සංසිද්ධීන් රාශියකින් දැනෙන මෙන්ම පෙනෙන කාරණා කීපයක්.

උදාහරණ ලෙස ශ්‍රී ලාංකිකයින්ට සෘජුවම දැනෙන්නේ අධික අකල් වැස්ස, අකල් නියං සමය, දරුණු වෙරළ ඛාදනය සහ ඔරොත්තු නොදෙන මට්ටමේ දිවා රාත්‍රී අකල් වායුගෝලීය උෂ්ණත්ව ඉහල යාම හෙවත් රස්නය යන පාරිසරික විපර්යාසයන් ය. ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා ප්‍රංශයේ පැවැති එක්සත් ජාතීන්ගේ දේශගුණ විපර්යාස පිළිබඳ ජාත්‍යන්තර සමුළුවට සහභාගී වුණා. ඒකෙන් පැහැදිලියි පරිසර හානියේ පරිමාව අතිවිශාල බව. හරිත ගිණුම යාවත්කාලීන කළ යුතු බව, පමා නොකළ යුතු බව දැන් දැන් පැහැදිලියි.

**හරිත ජාතික ගිණුම**

හරිතප්‍රද, හරිතාගාර, හරිතවායු හා හරිත වැස්ම කියන පදත්, ඉන් කියවෙන කාරණා ගැනත් බොහෝ විට මානව සමාජයේ බොහෝ අය දන්නවා. ඒත් හරිත ගිණුම ගැන බොහෝ අයට අවබෝධයක් නැතුව ඇති. ගිණුම් ගැන කියවෙන්නෙ ගණන් හිලව් බැලීමේදීයි. කිසියම් ව්‍යාපාර කටයුත්තක දී, වත්කම් බැරකම් ප්‍රකාශනයේ දී, ලාභ අලාභ සැසඳීමේ දී, ගෙවීම් පියවීම් කාර්යයේ දී වගේ ඇස්තමේන්තු ගත කටයුතුවල දී ගිණුම් පවත්වාගෙන යාම විෂයානුබද්ධ සම්ප්‍රදායක්. ඒත් බොහෝවිට සාම්ප්‍රදායික ජාතික ගිණුම් සැසඳීම්වල බොහෝ අඩුපාඩු තියෙනව. ඒ අඩුපාඩු නිසා එමඟින් සටහන් කරන චිත්‍රය නිවැරදි රූපයක් වෙන්නෙ නෑ. විශේෂයෙන්ම සංවර්ධනය වැනි අතිශය සූක්‍ෂම තත්ත්වයක් මැනීමේ මිම්මක් හැටියට ජාතික ගිණුම් ක්‍රමවලත් අඩුපාඩු බොහොමයි.

ආර්ථික වර්ධනය, ආර්ථික සංවර්ධනය හා තිරසාර ආර්ථික සංවර්ධනය කියන අවස්ථා සැසඳීමේ දී විශේෂ අංශ තුනක් ගැන ගැඹුරු අවධානය යොමු කරනවා. කෘෂිකර්මාන්ත, කර්මාන්ත හා සේවා අංශයේ හැසිරීම් රටාව තමයි ඒ ගැඹුරු අවධානයට යොමු වෙන්නේ. මෙහි දී ආර්ථික වශයෙන් දියුණු රටවල්, එසේ දියුණු රටවල් මට්ටමට ඉහළට එස වුණේ කාර්මික අංශයේ ඇති වූ වර්ධනය නිසයි. විශේෂයෙන්ම වර්තමානයේ දියුණු රටවල්වල ඇති වූ මේ වේගවත් කාර්මික වර්ධනයත් සමඟම පරිසර දූෂණය හා ස්වභාවික සම්පත් ශීඝ්‍රයෙන් ක්‍ෂයවීමත් වේගවත් වුණා. ශක්තිය යුක්තිය කරගත් ලෝක දේශපාලන මෙහෙයුමක් වන මෙම පාරිසරික හානිය පිළිබඳ දේශපාලකයින් හා ඔවුන්ගේ ආශීර්වාද ලබන බහු ජාතික ව්‍යාපාර හිමියන් විසින් නොතකා නොසලකා හැරියත් ආර්ථික විද්‍යාඥයින්ගේ සූක්‍ෂම අවධානය යොමු වුණා. එහි ප්‍රතිඵලයක් වශයෙන් පරිසරයට හා පොදු ස්වාභාවික සම්පත්වලට සිදුවන හානියත්, එහි පිරිවැය ගණනය කිරීමත් ‘හරිත ජාතික ගිණුම‘මඟින් කෙරෙනවා.

කාර්මික නිෂ්පාදනය වැඩි වීමත් සමඟ පොදු පරිසර සාධකවලට හා ස්වාභාවික සම්පත්වලට සිදුවන හානිය ගණනය කිරීම මහා භාරදූර කාර්යයක්. ඒ වගේම හානියට, දූෂණයට හා ක්‍ෂයවීමට ලක්වන

වායුගෝලය, ජලගෝලය සහ පාංශු ගෝලය යළි යථාතත්වයට පත් නොවීම නිසා එහි පිරිවැය ගණනය කිරීම ද මහා භාරදූර කාර්යයක්. ශක්තිය යුක්තිය කරගත් මෙම සංවර්ධන ක්‍රියාවලියේ ප්‍රතිඵලයක් හැටියට සිදුවන වායුගෝලීය ප්‍රමිතිය වෙනස්වීම, කාලගුණ රටාවන් වෙනස්වීම, ස්වභාවික ශාඛ හා සත්ත්ව කොට්ඨාස වඳ වී යාම, ගෝලීය උණුසුම ඉහළ යාම, ඕසෝන් වියන තුනී වීම හා සිදුරු හටගැනීම, ලෝක ප්‍රජාවට භයානක ලෙඩ රෝග බෝවීම, ගොඩබිම් සාගර ජලයට යටවීම, පිරිසිදු පානීය ජලය අහිමිවීම හා භූගත ජල උල්පත් සිඳීයාම, කෘෂිකාර්මික භූමි නිසරු වීම නිසා ආහාර හිඟ වීම. ගොමරිටි යට ගොස් තිරුවානා කැට මතු වීම වැනි (අබුද්දස්ස යුගයේ සම්ප්‍රාප්තිය මගින් සිදුවන) හානිකර ලක්ෂණ කිහිපයක් ලෙස දැක්විය හැකියි. ඒ වගේම තවත් බලවත් ගැටලුවක් හැටියට වර්තමානිකයන් ස්වභාවික සම්පත් ශීඝ්‍රයෙන් පරිභෝජනය කිරීම නිසා අනාගත පරපුරට උග්‍ර සම්පත් හිඟයකට මුහුණ දීමට සිදුවන බව ද සත්‍යයක්.

සංවර්ධනයේ නාමයෙන් දළ ජාතික නිෂ්පාදිතයට හෝ ශුද්ධ ජාතික නිෂ්පාදනයට ඇතුළත් නොකරන පාරිසරික පිරිවැය පිළිබඳ ඇහැ කන පාදන්නේ හරිත ගිණුමෙන්. පිරිවැය පෙන්වා දෙන්නේ හරිත ජාතික ගිණුමෙන්. ගිණුම් ශේෂයට යට ඇඳුම් අන්දවන්නේ හරිත ගිණුම මගින්.

**පරිසර හානිය ගිණුම් ගත නොකිරීම**

ගණකාධිකාරීවරු තමයි ගිණුම් තැබීම ගැන විශේෂඥයො. ප්‍රාග්ධන ගිණුම, ආදායම් වියදම් ගිණුම, වත්කම් හා වගකීම් ගිණුම, ලාභාලාභ ගිණුම වගේ ප්‍රධාන සංකීර්ණ ගිණුම් සකස් කරන්න ගණකාධිකාරීවරු දක්ෂයි. එහෙම දක්ෂකම් පෙන්නන්න පුළුවන් වෙන්නෙ අවශ්‍ය කරන දත්ත ඔක්කොම ලැබෙන නිසා. එහෙම නැත්නම් විගණනයකින් සැබෑ දත්ත අනාවරණය කරගැනීමටයි සිද්ධ වෙන්නෙ.

ඒත් භාණ්ඩ හා සේවා නිෂ්පාදනයේ දී පොදු පාරිසරික සම්පත් භාවිත කිරීමෙන් පරිසරයට සිදුවන කෙටිකාලීන, දිගුකාලීන හා සදාකාලීන හානිය පිළිබඳ දත්ත ගණනය කිරීම ආර්ථික විද්‍යාඥයන් මුහුණ දෙන ගැටලුවක්. මේ සඳහා අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග පිළිබඳ දැන් දැන් කඩිනම් අවධානය යොමු වෙලා තියෙන බව පේනවා. ඒ බව ඉතාමත් පැහැදිලිව පේන්නෙ, මෙම පරිසර හානියේ බරපතළකම ටිකෙන් ටික දැනෙන්නට පටන් ගත්ත පනහේ දශකයේ හා හැටේ දශකයේ ඉඳලා. ඒ කාලෙ පටන් ගත්ත ජාත්‍යන්තර පාරිසරික සමුළුවලින් ප්‍රබල කාර්මික රටවල් ගිවිසුමට අත්සන් නොකර නැගිටලා ගියා. අද එදාට වඩා තත්ත්වය බරපතළයි. මානව පැවැත්ම බරපතළ විදියට අනතුරේ. ඒ නිසා තිරසාර සංවර්ධනයක් ගැන හංසගීත ගායනා කරන රටවල් වලට, ඔවුන් උදාකළ බරපතළ හානිදායක තත්ත්වය ගැන ශක්ති පමණින්, ඥාන පමණින් පෙන්වා දිය යුතුමයි. ඒ සඳහා ඇති එකම කැඩපත හරිත ජාතික ගිණුමයි. ඒක හැකිතරම් නිවැරදිව ගණනය කිරීමට හඳුනාගත් තත්ත්වයන් කීපයක් මේ විදියට සටහන් කරන්න පුළුවන්.

**පිරිවැය ගණනය කිරීම**

සෑම මානව නිෂ්පාදනයකටම කිසියම් පිරිවැයක් තියෙනවා. ඒකට කියන්නෙ ආවස්ථික පිරිවැය කියලයි. පිරිවැය කියන්නෙ අනිවාර්යයෙන්ම දරන්න සිද්ධවෙන වියදමක්. කිසියම් නිෂ්පාදනයක මිල නියම කරනකොට ආවස්ථික පිරිවැයත්, ලාභාංශයත් එකතු කරලයි ඒ මිල සටහන් කරන්නෙ. ඒත් දළ ජාතික නිෂ්පාදිතය හෝ ශුද්ධ ජාතික නිෂ්පාදිතය ගණනය කිරීමේ දී පාවිච්චි කරන ලද පොදු පාරිසරික සාධකවලට සිදුවන ක්ෂයවීම හෝ හානිය ගණනය කිරීම සිද්ධවෙන්නෙ නැහැ. පාරිසරික හානිය නිසියාකාරව ගණනය කිරීම ගැටලුවක්. ඒ වගේම අති දුෂ්කර කාර්යයක්. සරල උදාහරණයකින් මෙම ගණනය කිරීමේ බරපතළකම තේරුම් ගන්න බලමු.

පරිසර සාධකයක් විනාශ වීම නිසා අවට පරිසරයේ සිටින ජෛව ගෝලයට හානි සිද්ධ වෙනවා. ගහ කොළ, සතා සීපාවා මෙන්ම මිනිසාට ද නොයෙක් ලෙඩ රෝග වැළඳෙනවා. ඒ රෝගී තත්ත්වයන්ගෙන් සියලුම ශාඛ හා සත්ත්ව කොටස් යථා තත්ත්වයට පත් කර ගැනීම සඳහා විශාල වියදමක් දැරීමට සිද්ධ

වෙනවා. ඒ වියදම මුළුමනින්ම පාරිසරික පිරිවැයක්. ඒක ගණනය කිරීම ඉතාමත් අසීරු කාර්යයක්. ඒත් පාරිසරික සම්පත් ක්ෂයවීමෙන් සිදුවන නිෂ්පාදනයේ අඩුවීමත්, ශ්‍රමිකයන් රෝගී වීමෙන් සිදුවන බෙලහීන වීමත්, ජීවිත හානියත් දළ වශයෙන් තක්සේරු කිරීමෙන් පාරිසරික හානියේ අගය තක්සේරු කරන්න පුළුවන්.

ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර ජලතලාව දූෂණය වීමෙන් වකුගඩු, පිළිකා වැනි රෝග වසංගතයක් වගේ පැතිරී යාමත්, හිරිගල් කැඩීමෙන් වෙරළ සම්පත් ඛාදනය වීමත්, අභ්‍යන්තර වන විනාශය නිසා දේශගුණය හා කාලගුණයේ විපර්යාස හටගැනීමත්, නාගරික ප්‍රදේශවල වායු දූෂණය ඉහළයාම මගින් උණුසුම ඉහළයාමත්, එමඟින් ගෝලීය උණුසුම ඉහළ යාමට කිසියම් දායකත්වයක් දැරීමත්, ඉමක් නොපෙනෙන පාරිසරික හානියේ සෘජු හා වක්‍ර ගැටලු වේ. පිරිවැය ගණනය කිරීමේ අපහසුව මත පරිසර හානියේ බරපතළ බව කෙතරම්දැයි තේරුම් ගැනීම අපහසුවක් විය නොහැකියි.

**ඒක පුද්ගල ආදායම**

ඒක පුද්ගල දළ ජාතික ආදායම (Gross National Income per Capital) තමයි, රට රටවල්වල ආර්ථික කටයුතු විශ්ලේෂණය කිරීමට යොදා ගන්නෙ. ඒ විශ්ලේෂණය හා ඉන් පස්සෙ ඒක පාදක කරගෙන කරුණු ලබන වර්ගීකරණය කරන්නේ ලෝක බැංකුව විසිනුයි. ලෝක බැංකුව ඒ වර්ගීකරණය ඒක පුද්ගල දළ ජාතික ආදායම අනුව පහළ ආදායම් රටවල්, මධ්‍ය ආදායම් රටවල් හා ඉහළ ආදායම් රටවල් කියල කොටස් තුනකට වර්ග කරනවා. ඒකෙනුත් මධ්‍ය ආදායම් රටවල් පහළ මධ්‍ය ආදායම් හා ඉහළ මධ්‍ය ආදායම් රටවල් කියල තවත් ක්‍රම දෙකකට ආයෙත් බෙදනවා. ලෝක බැංකුවෙ ඒ වර්ගීකරණයට අනුව ඒක පුද්ගල ආදායම් මට්ටම එක්සත් ජනපද ඩොලර්වලින් මෙහෙමයි.

පහළ ආදායම් රටවල් - එ.ජ. ඩොලර් 875 හෝ ඊට අඩු මට්ටම්.

මධ්‍ය ආදායම් රටවල් - එ.ජ. ඩොලර් 875 සිට එ.ජ. ඩොලර් 10725 දක්වා

අ). පහළ මධ්‍ය ආදායම් රටවල් - එ.ජ. ඩොලර් 876 සිට එ.ජ. ඩොලර් 3465 දක්වා

ආ). ඉහළ මධ්‍ය ආදායම් රටවල් - එ.ජ. ඩොලර් 3466 සිට එ.ජ. ඩොලර් 10725 දක්වා

ඉහළ ආදායම් රටවල් - එ.ජ. ඩොලර් 10725 හෝ ඊට වඩා වැඩි මට්ටම්.

ශ්‍රී ලංකා මහ බැංකුවේ 2014 වාර්ෂික වාර්තාවට අනුව දළ ජාතික නිෂ්පාදනය සියයට 7.5 ක් ද, දළ දේශීය නිෂ්පාදනය සියයට 7.4 ක් ද වෙනවා. ඒ අනුව 2014 වර්ෂයේ ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදනය ඇමෙරිකානු ඩොලර් 3625 ක් ලෙස ගණනය කරල තියෙනවා. ඒ මට්ටම අනුව ශ්‍රී ලංකාව ඉහළ මධ්‍ය ආදායම් මට්ටම් රටක් වෙලා. හැබැයි හරිත ජාතික ගිණුමේ පිරිවැය කිසියම් විදියකට ගණනය කළා නම්, ශ්‍රී ලංකාවේ ඒක පුද්ගල දළ ජාතික නිෂ්පාදිතය ඇමෙරිකානු ඩොලර් 3625 ට වඩා අඩු අගයක් වීම නොවැලැක්විය හැකි කාරණයක් බව ස්ථිරයි.

*සංස්කරණය - චන්දන ජයවීර*